
ආරම්භය : 1945-09-30 ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය

"ධම්මො හවේ රක්ඛති ධම්මචාරිං"



70 වර්ෂය - ශ්‍රී. බු.ව. 2559 | 2015 ජුනි 02 | පොසොන් කලාපය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# පින්වත් ගෙදරක් !

ගෙදරක් හොඳවීම රටක් හොඳවීමේ අත්තිවාරම වේ. ගෙවල් කීපයක් සෑදුන තැන ගමෙකි. ගම් කීපයක් එකතු වීම පළාතකි. රටක් වන්නේද මේ ක්‍රමයෙනි. රටක දියුණුව ගෙදරකින් පටන් ගත යුතුයි.

පෞද්ගලික ජීවිතය පොදු සමාජය පිළිබඳ දියුණුවේ හෝ පිරි හීමේ මූලික කරුණක් වශයෙන් සැලකිය හැකිය. පුද්ගලික වශයෙන් ඔවුනොවුන් හොඳවීමට කල්පනා කෙරේ නම්, සුචරිතවත් සමාජයක් ඉබේම ඇතිවීම ස්වභාවික සිද්ධියකි. හොඳ සමාජයක් දකිනු කැමැත්තේ හොඳ පුද්ගලයෙක් විය යුතුයි. තමාම කල්පනා කිරීමෙන් හොඳ පුද්ගලයෙකු වනු මිස අන්‍යයෙකුට ඒ සඳහා වගකිය නොහැක. දෙවැන්නෙකුගෙන් සිදුවන්නේ යායුතු මග කියාදීම පමණි. බුදුවරුන් මාර්ග දේශකයෝය. ධර්ම මාර්ගය වේ. ඒ මාර්ග යෙහි ගමන් කිරීම අපට පැවරුණු යුතුකමෙකි.

''තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරා තථාගතා'' ''තොප තොප විසින්ම උත්සාහ කළ යුතුය. බුදුවරුන් මග පමණක් කියා දෙන්නාහුයයි'' බුදුරදුන් විසින් දේශනාකොට වදාලේ එබැවිනි. මේ සත්‍යය තේරුම් ගන්නා තුරු පින්වත් ගෙදරක් ඇති නොවේ. පින්වත් ගෙදර වශයෙන් අදහස් කරණුයේ ආචාරශීලීත්වය, නිහතමානීත්වය, කාරුණිකත්වය ආදී උසස් ගතිගුණ වලින් හෙබි මවු-පිය දූ දරු පරපුරකින් සැදුම්ලත් නිවසය. නො එසේ නම් ධනයෙන් කුලයෙන්, බලයෙන් හෝ බාහිර අලංකාරයෙන් පමණක් හැඩ ගැසුන පුද්ගලයන් වෙසෙන ගෙයත්, ගේ උයනත් නොවේ.

දුප්පත්කම කාලකන්ණිකමයැයි කල්පනා කිරීම නිසා දෝ ! අපේ බොහෝ ගෙවල් කාලකන්ණිකම නැමැති අඳුරේ නිමග්නව තිබේ. වාසනාවේ මුල මුදල් යයි සිතීම මහත් මුලාවකි. ජීවිතයක් සාර්ථක කර ගැනීමට අපට මිල මුදල් ද අවශ්‍යය, මිල මුදල් ඇත ද, ගුණ දහමින් තොර අඹු සැමියන් වෙසෙන ගෙය අපායක් වනු මිස ''පින්වත් ගෙයක්'' නම් නොවේ.

ස්ත්‍රියක් හා පුරුෂයෙක් අතිනත ගන්නා සරණ බන්ධනයට ''දීගේ'' යෑම යැයි සිංහලෙන් ව්‍යවහාර කරණු ලැබේ. දීගට යෑම යනු එහි තේරුමයි.

මරණය දක්වා දික් වූ බන්ධනයක් වන බැවිනි.

විවාහ වීමෙන් ඇති වන සම්බන්ධය හා වගකීම දිනකට දෙකකට නොව ජීවිතාන්තය දක්වාය. නීත්‍යානුකූලව සරණ බන්ධනයට පත් අඹු සැමි යුවල ගේ සම්බන්ධය හොඳ පරපුරක අත්තිවාරම වේ. එය ජීවිතය පිළිබඳ සන්ධි ස්ථානයකි.

අඹු සැමි යුවල දූ දරුවන් ලැබීමෙන් පසු ''මව්-පිය'' යන ගෞරව ස්ථානය ලබති. එවිට සමාජය පිළිබඳ වගකීම සිය ගුණයකින් වැඩි වන්නේය. හොඳ දූ දරුවන් ලබා හොඳ මව්පියන් වන්නට නම් ආදර්ශමත් හොඳ අඹු සැමියන් විය යුතුයි. හොඳ ස්ත්‍රියක් හා හොඳ පුරුෂයෙක් වසන ගෙය දෙව් විමනක් වේයයි බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ.

දිනක් බුදුරජාණන් වහන්සේ මධුරාවටත් වේරඤ්ජාවටත් අතරින් වැටුන රමණීය පාරක් දිගේ වැඩිසේක. මෙදින නැකත් දිනයක් බැවින් අලුත සරණ බන්ධනයට පත් යුවතිපතිහුද මේ මගෙහිම ගමන් ගත්හ. බුදුරජාණන් වහන්සේ මග මඟ ගමන් ගන්නා පිරිසට ඉඩ දී පසෙක වූ රැක් සෙවනෙහි වැඩහුන් සේක. ඒ දුටු පිරිස බුදුරජාණන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව උන්හ. එදා ඒ පිරිසට වදාළ ධර්මය ජව සූත්‍රය යි.

චත්තාරො මෙ ගහපති යො සංවාසා කතමෙ
චත්තා රො ජවො ජවොය සද්ධිං සංවසති ජවො
දෙවියා සද්ධිං සංවසති දෙවො ජවාය සද්ධිං සංවසති
දෙවො දෙවියා සද්ධිං සංවසති

ගෘහපතිවරුනි, මේ ලෝකයෙහි සහවාස හෙවත් එක්ව විසීම් සතරකි. ඒ සතර කවරහු ද? මළ ප්‍රේතයෙක් මළ ප්‍රේතියක් හා වසන පවුලය--දිව්‍ය කුමාරයෙක් මළ ප්‍රේතියක් හා වසන පවුලය-- දෙවඟනක් මළ ප්‍රේතයෙක් හා වසන පවුලය-දිව්‍ය කුමාරයෙක් දෙවඟනක් හා වසන පවුලය-මෙසේ මේ ලොව පවත්නා සියලුම පවුල් මෙහි සඳහන් වූ චතුර්විධ සංවාසයට ඇතුළත් වෙතියි වදාළ සේක.

යම් පවුලක සැමියා සතුන් මරා නම්, සොරකම් කෙරේ නම්, පරදාර සේවනය කෙරේ නම්, බොරු කිවා නම්, මත්පැන් පානය කෙරේ නම්, සිල් නොරකී නම්, ඊර්ෂ්‍යා ක්‍රෝධ මද මානයෙන් බරව ආගමට, රටට, ජාතියට, මව්පියන්ට, භාර්‍යාවට, දූ දරුවන්ට කළ යුතු යුතුකම් නොකෙරේ නම්, එපමණක් නොව කාලය කා දමමින් තැනින් තැන ඔවුනොවුන්ට නින්දා අපහාස කෙරෙමින් උපන්නා වෙනුවට කාලය ගෙවමින් පෙළවට බරව, රටට සාපයක්ව සිටී නම් මළ ප්‍රේතයා කියන්නේ ඔහුටය. හෙතෙම රජෙක් වූවත්, රජ ඇමතියෙක් වූවත්, කුලවතෙක් ධනවතෙක් වූවත්, ගුණයෙන් තොර නිසා ගුණ සිරුරෙන් මළ නිසා ''මළ ප්‍රේතයයි'' බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

ඔහුගේ භාර්‍යාවද, සතුන් මැරීම, සොරකම් කිරීම්, කේලම් කීම් ආදී පස්පව්, දස අකුසල් කෙරේ නම් මුල කී පව්ටු අරිටු ගතිවලින් යුක්ත වූවා ''මළ ප්‍රේතියකැයි'' කියන්නේ ඇටය. එවැනි ස්ත්‍රියක් රජ බිසවක් වූවත්, සිටු දේවියක් වූවත්, රුවැති කුලඟනක් වූවත් ගුණයෙන් තොර නිසා හෙවත් ගුණ සිරුරෙන් මළ නිසා ''මළ ප්‍රේතිය කැයි'' බුදුරජාණන් වහන්සේ වදාලසේක.

මෙසේ එකසේ පව්ටු ගති ඇති අඹු සැමි යුවලක් ''කොහොඹ ගසට කරවිල වැලගියා වගේ'' එක්ව වෙසේ නම් ඒ මළප්‍රේත පවුලකි. සමහර පවුලක සැමියා හොඳය. ඔහු දිව්‍ය කුමාරයෙකි. භාර්‍යාව නරකය. ඇ මළ ප්‍රේතියකි. ඒ එක්වීම දිව්‍ය කුමාරයෙක් හා මළ ප්‍රේතියක් සමග වූවාකි.

යම් පවුලක සැමියා නරක් වී භාර්‍යාව හොඳ වේද, සිල්වත් ගුණවත් වේද ඕ තොමෝ කුල ගොත් ආදියෙන් නිවට වූවත් ගුණයෙන් උසස් වූ හෙයින් දෙවඟනකි. සැමියා ගුණයෙන් මළ මිනියක්වද භාර්‍යාව ගුණයෙන් උසස් දෙවියන්වද වෙසෙන එම පවුල දෙවඟනක් හා මළ ප්‍රේතයකුගේ එක් වීමකි.

යම් පවුලක අඹු සැමි යුවලම පස් පවින් දුරුව කුසලට ලැදිව මුදු මොලොක් සිතැතිව, සමගි බැම්මෙන් බැඳී ප්‍රීතියෙන් වෙසේ නම් ඒ ''දෙවඟනක් හා දිව්‍ය කුමාරයෙකි''. මිහිබට සුරපුරත් එතනමය. මෙලොවද දෙවියන් මෙන් බැබලී පරලොවද දේවත්වයට පත්වේ. කරුණු මෙසේ හෙයින් මෙය කියවන ඔබද සිය නිවස දෙව් විමනක් කර ගැනීමට සිතනු මැනවි.

මෙම ජව සූත්‍රයෙහි පැනෙන පවුල් ජාති සතරින් මුලින්ම සඳහන් වූ තිරිසනුන් මෙන් ජීවත්වන කාලකන්ණි අඹු සැමි යුවලක් ඇති පවුල නියම ''මළප්‍රේත පවුලකි'' ප්‍රේත විමානයකි. දෙවනුව සඳහන් වූ පවුලේ සැමියා හොඳ වූවත් බිරිඳ හොඳ නැත. මෙසේ සඳහන් පවුලේ බිරින්ද හොඳ වූවත් සැමියා හොඳ නැත. මෙසේ අඩක් හොඳ අඩක් නරක පවුල් වලින් වැඩක් නැත. එවැනි පවුල් නිතරම අවුල් සහගතය (අද බොහෝ විට දික්කසාද නඩු ගැන අසන්නට ලැබෙන්නේ ද මේ නිසා යයි සිතමි.)

සතර වෙනුවට සඳහන් කළ සිල්වත්, ගුණවත් සුවිනීත අඹු සැමි යුවලක් ඇති පවුලම පැසසිය යුතුයි. ඒ උසස් තත්වය ලැබීමට වග ලබාගත යුත්තේ ස්වාමියා සහ භාර්‍යාවත්ය. සරණ බන්ධන ජීවිතය පිළිබඳ වැදගත් සිඬියකි. දියුණුවේ හෝ පිරිහීමේ පටන් ගැන්ම සරණ බන්ධනයයි. දියුණුවේ දිනුම් කණුව කරා දුවන අඹු සැමි යුවලකගෙන් ඉටු විය යුතු යුතුකම් රාශියකි. ඒ යුතුකම් නොපිරිහෙලා ඉටු වෙතොත් සාමය රැකේ. දියුණුව උදාවේ. පින්වත් ගෙදරක් ඉදිවේ.

අප සංගමයට වසර 70 සම්පූර්ණ වෙමින් පවතියි. එය නිමිත්තෙන් එම වසර 70 තුල අප සංගමයට සාරගර්භ දහම් ලිපිලිව් ධර්මධර භික්ෂූන් වහන්සේලාගේත්, ගිහි උතුමාණන්ලාගේ ලිපි අපගේ නවක සාමාජිකත්වයට හා පාඨකයන්ට කියවීමට සැලැස්වීමට සංගමය තීරණය කර ඇත. ඒ අනුව මෙවර පොසොන් කලාපය දහම් රසික හදවත් දිනාගත් විසිතුරු **ධම්ම කථික ශ්‍රී සද්ධම්වාගීවරාචාරය්‍යී, කොළඹ නව කෝරළය සහ නව තොටමුනේ හිටපු ප්‍රධාන සංඝනායක ගෞරව කොටිකාවත්තේ සද්ධාතිස්ස නාහිමි** අපට සැපයූ ලිපියක් පල කරනු ලැබේ. මෙම ලිපිය කියවන ඔබ සැම උන්වහන්සේට ශාන්ත නිවන් සුව ප්‍රාර්ථනා කරන්න.